43)

MR 3

# අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව සම්පත් නාස්තිය හා එය වලක්වා ගැනීමේ උපක්‍රම පිළිබඳ අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනය

5 JAN 1989
LIBRARY

ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
නිබන්ධය

UCLIB
414655

කහඳුව පතිරත්නැහෙලාගේ කමලා විමලධර්ම
සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි
අධ්‍යාපන ඩිප්ලෝමා
(විශිෂ්ඨ සාමාර්ථ)
විභාග අංකය: M.Phil/19

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ
ශ්‍රී ලංකාව.

414655

1988 මාර්තු 01 දින.

Class No.
Acc. No. 414655
CR
UNIVERSITY OF ... LIBRARY ... SRI LANKA

සංක්ෂේපයෙන්

ඉන්දියාවේ හාටොග් කමිටුව මගින් 1929 දී ඉන්දියාවේ අධ්‍යාපනය පිළිබඳ ව කළ පහත සඳහන් ප්‍රකට ප්‍රකාශය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් අදට ත් උචිත බව පෙනේ.

"සමස්ත අධ්‍යාපන ක්‍රමය පුරා ම අපතේයාම් හා ඵලදායිතාවයෙන් තොරවීම් පවතී."

ශ්‍රී ලංකාව, අනෙකුත් මෙම කලාපයේ සංවර්ධනය වන රටවල් හා සසඳන විට අධ්‍යාපන සංවර්ධනය සම්බන්ධයෙන් යම් යම් ප්‍රගතියක් දක්වා ඇති නමුත් ඇය විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තව දුරටත් ඉටු කළ යුතු කාර්යය භාරයන් බොහෝ ය. උසස් මට්ටමක සාක්ෂර ඥානය, ඉහළ සහභාගී අනුපාතයන්; මුළු දිවයින පුරා ම විසිරී ගිය පාසල් පද්ධතියක්, විශාල උගත් ගුරු හමුදාවක් හා උසස් ගුරු – ශිෂ්‍ය අනුපාතයක්, සියලු මට්ටමේ ම අධ්‍යාපනය නොමිලයේදීම, අධ්‍යාපනයේ ස්ත්‍රී –පුරුෂ භේදය අවම මට්ටමකට ගෙන ඒම, දියුණු පරිපාලන ව්‍යුහයක් ආදී ලක්ෂණ ශ්‍රී ලංකා අධ්‍යාපනයේ පසුගිය දශක කිහිපය තුළ දී ලබාගත හැකි වූ සතුටුදායක කරුණු ලෙස සැලකිය හැකි ය.

එහෙත් තවමත් ශ්‍රී ලංකාව සර්වජන ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා නැත. අධ්‍යාපනයේ විවිධ අඩුපාඩුකම් භෞතික හා මානව යන අංශ දෙකේ ම ප්‍රදර්ශනය වේ. අධ්‍යාපන චක්‍රයන් සම්පූර්ණ නො කොට ආපසු ඇද හැලෙන්නන්, අසමත් වන්නන් සහ එදිනෙදා පාසල් නො පැමිණෙන්නන් ආදී වශයෙන් කාර්යක්ෂමතාව අඩු කරවන ලක්ෂණ, මෙන් ම; ප්‍රාදේශීය විෂමතාවයන්, විෂයමාලාව අදාළ නොවීමේ ගැටලු, අධ්‍යාපන චක්‍රයන් අවසන් කරන්නන්ට ඵලදායී රැකියාවක් නො ලැබීම හා එම නිසා ඇතිවන කලකිරීම් ආදී විවිධ ප්‍රශ්න ශ්‍රී ලංකා අධ්‍යාපනය සම්බන්ධයෙන් ජය ගතයුතු අභියෝගයන් මෙම අභියෝගයන් ජය ගැනීම සඳහා ශ්‍රීලංකා අධ්‍යාපනයේ දක්නට ඇති ප්‍රධාන අර්බුදය සම්පත් හිඟකම ය. ශ්‍රී ලංකාව පමණක් නොව දියුණුවන බොහෝ රටවල දක්නට ඇති

ප්‍රධාන ගැටලුව ද සම්පත් හිඟයයි. මෙම ගැටලුව විසඳීම සඳහා ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් ගත හැකි ය.

1. අලුත් සම්පත් අධ්‍යාපන ක්ෂේත්‍රයට යොමු කිරීම
2. තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

ශ්‍රී ලංකාව ඇතුලු බොහෝ සංවර්ධනය වන රටවල වර්තමාන ප්‍රවනතාව වී තිබෙන්නේ එම රටවල සම්පත් අධ්‍යාපන ක්ෂේත්‍රයට යෙදවීමේ කිසියම් උපරිම මට්ටමකට පැමිණ ඇති බවයි. ඇත්තෙන් ම වර්තමාන යථාර්ථය වී ඇත්තේ, අධ්‍යාපන ක්ෂේත්‍රයට යොදන සම්පත්, වෙනත් ක්ෂේත්‍රවලට සාපේක්ෂව, යොදන සම්පත් ප්‍රමාණය වැඩි කරනවා වෙනුවට අඩු කිරීමයි. මෙම ප්‍රවනතාව තුළ ශ්‍රී ලංකාව ඇතුලු සංවර්ධනය වන රටවල ප්‍රධාන කරුණ විය යුත්තේ පළමු විසඳුම නොව දෙවන විසඳුම දෙසට නැඹුරුවීමයි. එනම් දැනට අධ්‍යාපන ක්ෂේත්‍රයේ යොදා ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමයි. මෙහිදී සම්පත් අපතේ යාම වළක්වා ගැනීම පිළිබඳ මුලින් සඳහන් කළ ප්‍රධාන ගැටලුවට මුහුණ දීමට අපට සිදු වේ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන තේමාව ද මෙම සම්පත් අපතේ යාමේ ගැටලුව හඳුනා ගැනීම හා එයට සකාර්ය ප්‍රතිකර්ම මොනවාදැයි සොයා බැලීම ය.

මෙම මූලික ගැටලුව අංශ දෙකකින් සීමා කර ගැනීම මෙම අධ්‍යයනයෙන් සිදු කරන ලදී. ගැටලුවේ එක් අංශයක් පමණක් එනම් 'මානව සම්පත් අපතේ යාම' පමණක් මෙම අධ්‍යයනයට හසුකරගන්නා ලදී. අනෙක් අතට ගැටලුව ශ්‍රී ලංකාව පුරා විසිරීම පිළිබඳ ප්‍රාදේශීය සීමාවක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයට සුවිශේෂ ලෙස සීමා කර ගැනිනි. මේ අනුව වර්තමාන අධ්‍යයනය මෙසේ හඳුන්වන ලදී.

"අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව සම්පත් නාස්තිය හා එය වළක්වා ගැනීමේ උපක්‍රම පිළිබඳව අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනය".

අධ්‍යාපන ක්ෂේත්‍රයේ යෙදවී ඇති 'මානව සම්පත්' ප්‍රධාන වශයෙන්

දෙකොටසකට බෙදා ඇත. 'ශිෂ්‍ය සම්පත්' සහ 'ගුරු සම්පත්' යනුවෙනි. මෙහිදී ශිෂ්‍යයින්ගේ අංශයෙන් සිදුවන සම්පත් නාස්තිය ප්‍රධාන අංශ තුනක් ඔස්සේ ගණනය කෙරෙයි. එය සිසුන්ගේ දිනපතා පාසල් නො පැමිණීම, සිසුන් අසමත්වීම සහ සිසුන් අතරමග දී පාසලින් ගිලිහීයාම යන ප්‍රධාන අංශ තුනයි.

ගුරු සම්පත් නාස්තිය ද ප්‍රධාන අංශ තුනක් ඔස්සේ ගණනය කෙරෙයි. එනම් ගුරු ප්‍රවාසිතාව, දෛනික පාසල් කටයුතුවල දී සිදුවන අතපසුවීම් සහ අතිරික්ත/ හිඟ ගුරු මණ්ඩල නිසා සිදුවන නාස්තිය යනුවෙනි.

ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදුවන සම්පත් නාස්තියේ දෙපැත්ත ම ප්‍රමාණාත්මක ව අගය කිරීමකට ලක් කිරීම මෙහි පොදු අරමුණු විය.

මානව සම්පත් අංශයේ සිදුවන මෙම නාස්තිවීම්හි ගුණාත්මක අගය විමසීමේ අරමුණින් යුතු ව සම්පත් නාස්තියට බලපා ඇති හේතු සාධක විමර්ශනයට ලක් කිරීම මෙහි තවත් අරමුණක් වෙයි.

මෙසේ සිදුවන සම්පත් නාස්තිය කෙරෙහි බලපා ඇති හේතු සාධක ආශ්‍රයෙන් බැස ගත හැකි නිගමනයන් පිළිබඳ ව සලකා බැලීම ද මෙහි තවත් අරමුණක් වෙයි. තවද මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා යොදාගත හැකි ප්‍රතිකර්මයන් පිළිබඳ විමසා බැලීම ද මෙහි ඇති වැදගත් අරමුණකි.

මෙම පර්යේෂණ වාර්තාවෙහි පළමුවැනි පරිච්ඡේදයෙන් ගැටලුව හඳුනා ගැනීමට ප්‍රයත්නයක් දරයි. මෙහි දී අධ්‍යාපනය යන්න පිළිබඳ ව කෙරී ඇති නිර්වචනයන් රාශියක් ආශ්‍රයෙන් අධ්‍යාපනයේ නව නැම්මක් වූ 'අධ්‍යාපනය ආයෝජනයකි' යන තේමාව යටතේ විග්‍රහයක් ඉදිරිපත් කෙරෙයි. එහිදී තව දුරටත් අධ්‍යාපන සම්පත් යන්න කවරේ ද, අධ්‍යාපන සම්පත් අපතේ යෑම යනු කවරේ ද? අධ්‍යාපන සම්පත් අපතේ යෑම්හි ප්‍රතිවිපාක කවරේ ද යන්න පිළිබඳ ව විස්තර කෙරෙන අතර, ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් මෙම ගැටලුවේ ස්වභාවය, ගැටලුව විග්‍රහ කිරීමේ වැදගත්කම සහ මෙම අධ්‍යයනයේ සුවිශේෂ අරමුණු පැහැදිලි කිරීම ද කර ඇත.

මෙම අධ්‍යයනයේ දෙ වැනි පරිච්ඡේදය වෙන් වී ඇත්තේ අදාළ පර්යේෂණ සාහිත්‍ය විමසීම සඳහා ය. මෙම අධ්‍යයනයට මූලික වූ සම්පත් නාස්තිය පිළිබඳ ගැටලුව විග්‍රහ කිරීම සඳහා මීට පෙර ජාත්‍යන්තර මට්ටමින් කරන ලද විදේශ අධ්‍යයනයන් රාශියක් ද, ශ්‍රී ලංකාවේ කරන ලද පූර්ව අධ්‍යයනයන් රාශියක් ද මෙහි දී විමර්ශනයට ලක් කෙරිණි. මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ සංකල්ප හඳුනා ගැනීමටත් මෙම අධ්‍යයනයෙහි යොදාගෙන ඇති නිර්වචන හා සම්පත් නාස්තිය මැනීමට යොදාගෙන ඇති උපකරණ හා ක්‍රම ශිල්ප හඳුනා ගැනීමටත් මෙහි දී උත්සාහ කරන ලදී. ඒ තුළින් අධ්‍යතන අධ්‍යයනය සඳහා අවශ්‍ය පූර්ව ලෝකය ලබා ගැනීමට හැකියාවක් ලැබුණි.

මෙහි තෙ වැනි පරිච්ඡේදය අධ්‍යයනය පිළිබඳව සංකල්පමය රාමුවක් ගොඩනගා ගැනීම සඳහා වෙන් විය. එහි දී මෙම අධ්‍යයනයට මුල් වූ යම් යම් සංකල්ප පිළිබඳ නිර්වචනය කිරීමට ත් එහි අර්ථ නිරූපණය කිරීමත් සිදු කෙරිණි. ඒ අනුව අධ්‍යයනය සිදු කෙරෙන ආකාරය පිළිබඳ විද්‍යාත්මක සැළසුමක් සකසා ගැනීමට අවශ්‍ය පදනම වැටුණි.

පර්යේෂණ වාර්තාවේ සිව් වැනි පරිච්ඡේදය වෙන් වී ඇත්තේ අධ්‍යයනයේ සැළැස්ම සහ ක්‍රම පිළිවෙත ඉදිරිපත් කිරීම ය. එහි දී අධ්‍යයනයට පදනම් වූ අරමුණු සුවිශේෂ ව පැහැදිළි කිරීම ත්, අධ්‍යයනයට පදනම් වූ ජනගහනය හා තෝරා ගත් නියැදිය විස්තර කිරීම ත්, අධ්‍යයනය දියත් කළ ආකාරය පැහැදිළි කිරීම ත් කෙරිණි. තවද දත්ත රැස් කිරීම සඳහා යොදාගත් උපකරණ සහ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගත් ක්‍රම ශිල්ප පිළිබඳව ද විස්තරයක් ඉදිරිපත් කර ඇත.

පර්යේෂණ වාර්තාවේ පස් වැනි පරිච්ඡේදයෙන් රැස් කරගත් දත්ත විශ්ලේෂණයට ලක් කෙරිණි. අදාළ සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් ශිෂ්‍ය සම්පත් නාස්තියේ ප්‍රමාණාත්මක තත්ත්වය හා ගුරු සම්පත් නාස්තියේ ප්‍රමාණාත්මක තත්ත්වයන් ද විග්‍රහ කර ඇත. තවද මෙම මානව සම්පත්හි සිදුවන නාස්තියේ ගුණාත්මක අගය පිළිබඳ ව විමසුමට ලක් කර ඇත.

මෙම වාර්තාවේ හය වැනි පරිච්ඡේදය වෙන් වී ඇත්තේ පර්යේෂණය තුලින් එළඹුනු නිගමනයන් ඉදිරිපත් කිරීම සඳහා ය.

පර්යේෂණය තුලින් බැසගත් නිගමනයන් අනුව ශිෂ්‍ය සම්පත් නාස්තිය අංශයෙහි, වෙනත් ආසියාතික සංවර්ධනය වන බොහෝ රටවල දක්නට නො ලැබෙන ආකාරයකට ස්ත්‍රීන්ට වඩා පුරුෂයින් අතර නො පැමිණීමේ ප්‍රතිශතය ද අසමත්වීමේ ප්‍රතිශතය ද සහ විපතිත වීමේ ප්‍රතිශතය ද ඉහළ මට්ටමක පැවති බව අනාවරණය කර ගත හැකි විය. මෙයට ප්‍රධාන හේතු ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පසුබිම පදනම් කොට පැන නැගී තත්ත්වයක් බව අනුමාන කෙරේ.

නාගරික, අර්ධ නාගරික, හා ග්‍රාමීය බව අනුව බලනවිට ග්‍රාමීය පාසල් තුළ නො පැමිණීම, අසමත්වීම හා විපතිත වීම ඉහළ මට්ටමක පැවති බව අනාවරණය විය. පාසල් වර්ගීකරණය අනුව බලනවිට 2 වර්ගයේ ග්‍රාමීය පාසල් තුළ ඉහත දී ඇති අංශ තුනෙන් ම සිදුවන නාස්තිය අධික බව පෙනී ගිය කරුණකි. ශ්‍රේණි මට්ටම් අනුව බලන විට ඉහළ ම නො පැමිණීම 7 වැනි ශ්‍රේණියේදීත්, ඉහළ ම අසමත්වීම 10 වැනි ශ්‍රේණියේ දීත් සහ ඉහළ ම විපතිත වීම 5 වැනි ශ්‍රේණියේ දී බවත් අනාවරණය විය. මෙම සොයා ගැනීම් ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමයේ දක්නට ඇති විෂමතාවන් හා හොඳින් ගැලපී යන බව පැහැදිලිව පෙනේ.

ගුරු සම්පත් නාස්තිය අංශයෙන් කරන ලද විග්‍රහයේ දී ගුරුවරුන්ගේ සුදුසුකම් මත නිවාඩු ගැනීම වැඩිපුර ම සිදු වී ඇත්තේ උපාධිධාරී ගුරුවරුන් අතර බවත්, දෙවැනි තැන විවිධ සහතික ලාභී ගුරුවරුන් අතර බවත්, අඩු ම නිවාඩු ගැනීමක් සිදු වී ඇත්තේ පුහුණු ගුරුවරුන් අතර බවත් අනාවරණය විය. මෙම අනාවරණයන් මෙරට ගුරු වෘත්තියට බඳවා ගැනීම්, පුහුණුවීම් ආදී අංශයන්හි අනාගත තත්ත්වයන් තීරණය කිරීමට අදාළ කර ගැනීම යෝග්‍ය ය.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව විමසන විට වැඩිපුර ම නිවාඩු ගෙන ඇත්තේ ස්ත්‍රී පක්ෂය බව අනාවරණය විය. මෙහි දී අනාවරණය වූ ඉතා වැදගත් ලක්ෂණයක් වූයේ පුදුමයකට මෙන් ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන් හා පිට පළාත්වලින් පැමිණ සේවය

කරන්නවුන් ආශ්‍රයෙන් විමසීමේ දී වැඩිපුර නිවාඩු ලබා ඇත්තේ ගමේ පදිංචිකරුවන් අතර බව අනාවරණය වීම ය. විවිධ හේතූන් සහ විවිධ සාධක මුල් කර ගෙන සම්පත් නාස්තිය සිදුවන ආකාරය ප්‍රමාණාත්මක ව ගණනය කිරීම ත් එම තත්ත්වයන් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පසුබිම තුළ විග්‍රහ කිරීමට ත් උත්සාහ ගෙන ඇත.

සම්පත් නාස්තිය කෙරෙහි බලපා ඇති හේතු සාධක විමසීමේ දී, ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීවරුන් ආදි විවිධ කණ්ඩායම් තුළින් ඔවුන් දරන ආකල්ප විග්‍රහයක යෙදිණි. එය ද ලකුණු පැවරීමක් තුළින් ප්‍රමාණාත්මක ව අගය කිරීමට තැත් කෙරිණ. මෙහි දී පුද්ගල ආකල්ප හා අදහස් මත තීරණ ගැනීමේ සීමාසහිත බව ත්, මෙම නිගමන අනාගත පර්යේෂණ මගින් සනාථ හෝ අනාථ වීමේ අවශ්‍යතාවයන් පිළිගන්නා ලදී. කෙසේ වෙතත් අපතේයාම් පිළිබඳ හේතු පැහැදිලි කිරීමේ දී මෙම විවිධ ක්ෂේත්‍රවලින් මතු වූ අදහස් පැහැදිලි ලක්ෂණ කිහිපයක් මතු කරන ලදී. ඉහත සඳහන් ප්‍රමාණාත්මක හා ආකල්පමය අදහස් පදනම් කරගෙන අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන මානව සම්පත් නාස්තිය පිළිබඳව එළඹිය හැකි නිගමනයන් ඉදිරිපත් කිරීමක් මෙහි දී සිදු කෙරිණි.

මෙම හය වැනි පරිච්ඡේදයෙහි ම මේ සඳහා යෙදිය හැකි ප්‍රතිකාර්ය යෝජනා ඉදිරිපත් කිරීම ද සිදු කෙරිණි. ඒ අනුව ක්ෂේත්‍රයේ සම්පත් නාස්තිය වළක්වා ගැනීම සඳහා රාජ්‍යමය ප්‍රතිපත්ති තුළින් කළ හැකි පිළියම් ද පෞද්ගලික හා ස්වේච්ඡා මට්ටමින් කළ හැකි පිළියම් ද පැහැදිලි කෙරිණි.

මෙම අධ්‍යයනයෙන් හෙළි වූ තොරතුරු අනාගතයේ මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ කරන්නන්හට අවශ්‍ය දත්ත පදනමක් සැපයේ යයි සිතන අතර, ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ තීරණ ගැනීමට සම්බන්ධවන දේශපාලකයන්ට, පරිපාලකයන්ට හා අධ්‍යාපනඥයන්ට ප්‍රයෝජනවත් ප්‍රතිවේදයක් ගොඩ නගා ගැනීමට ඉවහල් වේ යයි අපේක්ෂා කෙරේ.